
# MAL KAWUDU SANDESAYA.



# මල් කවුඩු සන්දේශය

රන්දොඹේ

සේනානායක වලව්වේ

**හැන්රි ජෝන් මැන්දිස් වික්‍රම රත්න සේනානායක**

ශ්‍රෙෂ්ඨාධි කරණ ශාලාවේ නීතිඥ මැතිතුමාගේ අයැදුමෙන්

රන්දොඹේ

**ශාසනා ලඞ්කාර සාමින් වහන්සේ**

වි සි න්

රචනා කරණලදී.

රන්දොඹේ ඇල්. ආර්. ඩී. සොයිසා බලපිටියේ
පොලිස් උසාවියේ රැකොඩ් කිපර්තැන විසින්
කොළඹ “ සඳකිරණ යන්ත්‍රාලයේ” මුද්‍රණය කරවා
ප්‍රසිඞ කරණලදී.
ශ්‍රී. බු. වර්ෂ 2454.

ක්‍රි. ව. 1910.

# මල් කවුඩු සන්දේශය.

මේ වනාහි මල් කවුඩු නම් පක්ෂියෙකු දූත මෙහෙවරෙහි යෙදූ කළ හෙයින් අභෙදෝපචාරයෙන් මල් කවුඩු සන්දෙශ නම් විය.

මෙහි කථාශරීරය නම් කොස්ගොඩ වැලිකත්දේ සුදර්ශනාරාමාධිපති අමරපුර සිරිසද්ධම්මවංශ නිකායෙහි මහා නායක ධුරන්ධර සිරිසද්ධම්මවංසපාල ශ්‍රී **සුමඞ්ගලාභිධාන** මහා ස්ථවිර සාමිපාදයන් වහන්සේට ශ්‍රී බුද්ධ වර්ෂ 2448 අවුරුද්දේදී සෑදී තිබුන ඇස් රෝගය දුරලා සෙත ලබාදීම පිණිස දක්ෂිණ ලඞ්කාවෙහි දෙව්නුවර—දෙවුන්දර දේවාලයෙහි නෛකබල පරාක්‍රම ප්‍රතාපාලඞ්කෘත උත්පලවර්ණ සුරේන්ද්‍රයාට යාඥකරවීමට රාජකීය ආසියාතික සමිතියේ සාමාජිකයෙක්වූ කොකැටූ, කැනරි, අළුකොබෝ සන්දෙශාදියෙහිද කර්තෘභූත බලපිටියේ පොලිස් මහේස්ත්‍රාත් ධුරයේ කලක් වැඩබැලූ ස්වභාෂාභිවෘද්ධිකාමී අප ඥාතිභූත **එච්. ජේ. ඇම්. වික්‍රමරත්න** සේනා නායක ශ්‍රේෂ්ඨාධිකරණ ශාලාවේ නීතිඥ මැතිතුමාගේ ආරාධනාවෙන් රත්දෙණේ මහාමඞ්ගල සමුද්‍රාරාමයේ අප සොහොයුරු ශාසනාලඞ්කාර නම් කුඩා සාමීන් වහන්සේ විසින් මීට අවුරුදු හතරකට පෙරදී රත්දෙණේ පටන් දෙවුන්දර දක්වා ඇතම් ග්‍රාමාරාමාදියද වර්ණනා කිරීමෙන් රචනා කරණලද කාව්‍ය බන්ධනයකි.

කුඩා සාමීන් වහන්සේ නමකගේ මෙබඳු රචනාවක් දුටුවොත් නවීනයන්ගේ සිත්වලට වඩ වඩා ශාස්ත්‍රාභ්‍යාසයෙහි උත්සාහයක් ඇතිවීනම් එයද ඒකාන්තයෙන්ම ලොකාභිවෘද්ධියට අතිශයොපකාරයක් වෙයයි සැලකූ අප හිතෛෂී කිපදෙනෙකුගේ ඉල්ලීමද ඇතිව මෙය ඒ කාලයේදී ප්‍රසිද්ධ කරන්ට සූදානම්වෙන අතර මහා නායක සාමිපාදයන් වහන්සේම නිමිතිකොට මාදම්පේ දේවගොඩ ශ්‍රී වර්ධනාරාමාධිපති ගණාචාර්ය සිරිපවර යස පණ්ඩිත

**ධම්ම තිලකාභිධාන** නායක ස්ථවිර පාදයන් වහන්සේ විසින්ද විල්ලිහිණි නම් සන්දේශය රචනාකොට ප්‍රසිද්ධකළ හෙයින් උන් වහන්සේගේ ඒ කෘතියට ගෞරව පිණිස මෙය ප්‍රසිද්ධ කිරීම ප්‍රමාද කෙළෙමි.

ලාබාල ඇත්තන්ගේ මෙබඳු වැඩවල යම් යම් ඌනතා ඇතත් ඊර්ෂ්‍යා පරවසනොවූ සත්පුරුෂයෝ එය නොසලකා අපි රසයම විඳිනවා ඇත යන්න ගැණ කුමට කියම්ද? එබැවින් මෙහි අපි රස යම විඳිමින් මුන්වහන්සේගේ උත්සාහයෙහිලා සතුටුවනලෙස සියළු සුධීන් වෙත මෙයින් නිවේදනය කරන්නේ,

ලොකශාසනාභිවෘද්ධිකාමි,


**ඇල්. ආර්. ඩී. සොයිසා,**

බලපිටියේ පොලිස් උසාවියේ,

රකොඩ් කීපර් තැනැත්තා

**1910** ඔක්තෝම්බර් මස 27 වෙනි දින
රත්දෙමොඩ දීය.

# මල් කවුඩු සන්දේශය.



## නමදිම් තෙරුවන්.

1 සැරද වෙණ නදබඳ—නදන දන නද නඳදෙන
කිවිවත් වදන් වදනෙහි—මල් කවුඩුසඳ නිදුකින්

2 ලකල් රත්වන් මල්—කැකුලෙ 'ව නතුඬ සකිසොඳ
සුවිසිරි සොම්වණිත දන හඳ අද දිලිය
කිණිහිරි මල් සදිසි දිසි පා යුග දිලිය
නදුනු 'යන ගිලිමල්—කැණෝ'වි දෙවි මයිනෙ 'න සඳ
පිය පත් දෙක දලන නුබසර සුර අඟ න
පිය සිත් සිඳ නොගත්තුද? සලහට පව න
ම න් පි ණ නා ලද සිදහන කර දස න
කන් බ ර ණා නොකොලොද? සුපවර ලෙසි න
ම න් රැගෙණා නෙක දන සිතුසේ වස න
අ න් න ද නා නැත නුඹ දූකුම සමව න

3 පිය නඳනා  තිය ගිය දෙස දන විස  ර
පිය බඳ නා  සියපණ මෙන දිවුණක  ර
පිය වද නා  ඇසුමෙන දුකුමෙන තඹි  ර
පිය දස නා  ලද පලමාපිය මිතු  ර

4 යු ත්  වනසත් ගුණෙනි මිත් දන  ව රා හ රා
නි ත්  තෙන වැඩ කරති සිතුමිණ  පු රා ති රා
ස ත්  ගුණ යුතු මිතුරු මවදන්  ති රා ස රා
අ ත්  වන ලෙස අසව මතුවැඩ  ක රා' ද රා

5 දෙව් ව ර  සුරිඳු ගෙණ සිරිලකැවිත් තො  ස්න
දෙව් තුර  ලෙස පතර සිරිසත ලෝ ව  ස්න
දෙව් පුර  වසන රකිමින් සැසී ස  ස්න
දෙව් ව ර  උපුල්වන් සුරිඳුට මේ හ  ස්න

6 සු මි යු රු  නද දෙමිනි වන්සඳ කුස අඹ  ර
නි ර තු රු  පුරණ මා මන දෙළ නෙක අයු  ර
සු මි තු රු  පැසුලූ කියනෙම් එහසුන මෙව  ර
තොරතුරු  අසනු නායන මග පිය ලක  ර

7 රත්  ගැබ මෙන දකුණු ලකසිරි පිරි තොම  ද
මන්  ලොබ බැඳ රඳන සැමදන සසුනැසො  ද
දුන්  නුඹ වසන සයුර'ස සුසැදි මනන  ද
රත්  දෙඹ පසිදු මේ ගම දනු මිතුරු ස  ද

8 රත්දෙඹ  නඝා පතිරදු 'මැති රුපු දි  නුව
රත්දෙඹ  නමින් වෙහෙරක් කරවූ වෙ  නුව
රත්දෙඹ  පලක් පිදුවෙන් අරුතට අ  නුව
රත්දෙඹ  නම පළට විය මෙගමට ද  නුව

9 ගු ණ දු ල්  සඳසර 'තිදන් මහතෙරිඳු ව  ර
සු නි ම ල්  සැදූ සිහිනි කරවූ ලෝ පත  ර
සු වි ස ල්  බඹ විමන'තුල් පිවිතුරු ලක  ර
දනු ක ල්  මිහඹුගුල් සමුදුර රම මිතු  ර

10 සුගත  සුත සඟනලද සොඳ ගුණ විස  ර
සුගත  සසුන දද මිනැදුරු නම ප්ව  ර
දිගත  පතයසැ 'හි මාහිමි දම් ලක  ර
දිමුත  මේම වෙහෙර වදු අදරින මිතු  ර

11 ඥානා වි ත ර  දන මෙහින දෙන මෙන  සිරි සරණ
නි ර තු ර  සැක කරණ තැබුඡේ  සිරි සරණ
මෙ වෙ හෙ ර  සිරි දරණ ලද මුනි  සිරි සරණ
ම මි  තු  ර  වදිනු මැන ලබණට  සිරි සරණ

12 මි තු රු  සිරි පතුල වැඳ යලි පින් රුගෙ  ණ
මි තු රු  පෙර ගිරින් නැගි සඳ රුස් අරු  ණ
ඍ ඹු රු  කැල පුබුදුවූ සුවඳ පැතිරෙ  ණ
සොඳුරු  පොකුණ බල සතොසින දෙස දකු  ණ

13 සිරිගණ  සසුන සරහස කැල සිසුග  ත්න
සම ගින  සොඳින කළ ලෝවැඩ කුළුණි  ත්න
හිමි දුන  සොහොන බැඳි කොත දක බැතියේ  ත්න
නමදින  කලණ ගුණකඳ සිහිකර මි  ත්න

14 සතරේ  සොඳින් දන හිත වැඩකළ ලොව  ට
**වතුරේ  ගමයතිඳු** විසු **මහසෑ** රම  **ට**
මිතුරේ  ගොසින් පිණිපාකරසෑ රදු  ට
නතරේ  නොවී සහනද නැමද එනුතු  ට

ඉක්බිති ග්‍රාමා ලඞකා රෙක දෙශයක්
වර්ණනාකරමි, එදත්‍රාදර්ශණයකර.

15 සහස්  මද සරණ නැති පිහිට වෙන  ලිය
දහස්  ගණන් මිනි කැල නිරතුරු දි  ලිය
සහස්  රුස් පැතිර දිය දහර බැබ  ලිය
අහස්  ගඟ සපිරි මේ ගඟ සිරි සි  ලිය

16 දප් සිදු ර  දමා මිසදිටු දිටුද  ළය
**ගමිලකර  සමිනිගත** මැතිතොස් ද  ළය
සිප් සතර  දෙනසෙ තැබූ දූ පුත් කැ  ලය
මිත් පවර  නරඹ **පාසැල** සිත් ලො  ලය

17 ස  තු  රු  දන නිකර රඹවන නොම විත  ර
සො  දු රු  සිය පතර තෙද රුස කග සත  ර
මි  තු  රු  දන තඹරවන සියරුස අයු  ර
සො  දු රු  පුරු සිසිර සර සොමිගුණ විස  ර

18 නන්  සු  බ ගුණින  තුල නිතිදන මන රඳ  න
දූ න්  නු  බ කුසෙහි දුල යස රුස මහිමිදු  න
ර න්  දෙ ඹ නමි න දුලගම සුපිහිටි නද  න
ම න්  ලොබ බඳන බල මමිතුර දිනු විම  න

19 ගනදිග සතුරු සොරදන එඩි බිඳුර ද ල
මහග තෙද බලැති මැති වසන පැහැදු ල
පහග පෙල රඳන සිරි ලොවට පලක ළ
නොලැඟ බලම්නෙහි ගමනට වෙයි අවු ල

20 ද න ම න මෙ න නිතින සෙත ලබණට රුව ට
ම න පි ණ ව න ලෙසින කලකඳ කුමරිඳු ට
තැන තැන ව න දෙවොල් පෙල වෙත ගොස් සතු ට
ය න මැන ගෙණ පිහිට හැකිවීනම් නොසි ට

21 සලෙළු මත් වරණ සිඳ පතිවත අසි න
ම හ ලු වත් සමන නිති නොහැර සුරකි න
ස ඳ ලු මත් සරණ හැඳ පැළඳ අබර ණ
ය හ ලු නෙත් පිණන බල මෙගම කුලග න

22 නිරතුරු නොහැර සිතුසෙද අදහස ලෙසි න
සුරතුරු විලස දනහට සැපත ගෙණදෙ න
පලතුරු දරණ මනදෙළ පුරණ සැමදෙ න
මම්තුරු බලව පොල්ගස් පෙල මෙහි දිලෙ න

23 මිඅඹ ඇටඹ පේනිඹ පල බර මියු රු
පළු මොර කරක් නිල්මැලි උගුරඹ කදු රු
කොස් දෙල් තල් කිතුල් පුවගය ඈ මෙතු රු
නොස්නෙත් හැසිරෙමින් මේගම බල මිතු රු

24 ලදලු දුම්ඳු රදවටැ ‘සළ කොබො ළී ල
මුහුලු නිඹ අඟන පියලද අක්පළො ල
නිසුළු ඉදුවරණ සුවතුරු වසම් ද ල
යහලු බල මෙඇතුරු මුළු මෙහි උදු ල

25 කොවුල් කිර පරවි කහකුරුළු මියුරු ද
සැ වුල් කැනරි ඇටි කුල් මල් කවුඩු න ද
තු මු ල් බිඟුමෙ ඈ රුව පිළි රුව නොම ද
අ වු ල් වේය තව සර සඳුවත් සබ ද

26 සතත පින්කිරිය සපුරණ දන පි රිය
අනත සිරි සියල් ගමගිනි දසපි රිය
විතත ලෙව් මෙගම වනසේ දන පි රිය
අනත හැර වණන හොත් අනිකෙකු බැ රිය

27 පිරි වර දෙතිස් මහ ලකුණෙන් බුදු රුවන
පිරි සැදූයෙ නැ'සු සත සෙත දෙන දමු රුවන
පිරි සරු ගුණෙනි පින් කෙත්වන සඟු රුවන
පිරි තුටු සිතිනි පිණීපාකර මෙනෙ රුවන

28 තෙරුවන් වැඳ පුද මොක්සිරි ලබණ යු ර
මු රු ව න් යලි යැදුව මෙය කරණට නොහැ ර
සුරු ම න් ලෙස කරණී ඉටුකරණට මිතු. ර
සරු ව න් මකිස තිරකරණට තසිතුක ර

29 පු රණ බැති සිතිනි පිළිවෙත් දෙසු මුන් ද
කරණ මෙත් කුළුණු සිත සැමදෙන නොම ද
ද රණ ඇප් අරම අදිපතිකම පසි ද
සරණ පල් නමැති මහ තෙරිදු පාව ද

30 දසබ ල මුනි සසුන පැවිදිව බැති අද ර
වදහ ල දෙන 'පවග පාමොක් සිකා නිත- ර
මනකල නෙත්යුගසෙතම රකිනා පව ර
ගුණදුල රුවනදෙ යති සඳවදු මිතු ර

31 සුදසුන් කුළුණු බලඇති පඬි නිති සෙව් න
සුදසුන් ගතැති ඉඳුරන් සොඳ දමු බැව් න
සුදසුන් කරණ දියනද අප මුනි සසු න
සුදසුන් නමැති අපැදුරුතුම කර දස න

32 මොකැදුරු මුනි දෙසූ තෙවලා දම් සොඳි න
වි සි තු රු ලෙස දෙසා දනහද පොබ කර ණ
අ පැ දු රු සිරි සුද සුන බිදන් තෙර සුර ණ
ම මි තු රු තිදෙරින්ම වැඳ සමුගණු ගම න

23 සිරි ලක නාග දිවයින මිණී පලග සො ද
සිරි නැසුමටැ'ති කළනා යුදය පිළිබ ද
සිරි සෙත සලසන්ට විනෙ දනට දියත ද
සිරි ලක දෙවෙනිවර වැඩි දින අද සබ ද

34 සොඳේ නි ව න් සිරිදුන් මුනි වැඩි මෙදි න
සොඳේ ගුණෙ න් හිරු පත උදය සඳු දි න
සොඳේ සි ති න් සිහිකර ගුණතුන් රුව න
සොඳේ ග ම න් මමිතුරුසඳ අප රමි න

**35** නැ ව ත ත් අප ඇදුරු තුමගෙන් සමු රැගෙ ණ
කි රි බ ත් කා අහර කිස නිමවා සෙදි න
දි වි ය ත් නොකරණට පණිවා තිර ලෙසි න
නොප සිත් තබා මදකල් හිඳ මතු තොර ණ

**36** සුදු මල් පල ගජ හය පිරි කුඹු සොඳු රූ
සුදු වත් හැඳි සුදන කිරිදෙන් ගැබිනිස රූ
සුදු සෙමරය මේ ඈ අතුරෙන් මහ රූ
සුදු සු බලා පෙර මග නිමිති වැඩ ක රා

**37** උදය ගිර දිනිඳුවන් සෙද ගෙණ කිර් ණ
පුදය කර කුසුම‘හර කුසල තෙරුව න
උදය කර ණ විලසෙ ‘හ උවසු වැසිය න
නදය කර නදින නගු අඹරට කළ ණ

**38** අ ඹ ර ට පිවිස මදතැන් යනවිට මිතු ර
ප වු ර අරම ඉම පුර දෙර ඈත පත ර
ගොපුර සිට මදක් ගොස් නුඹදෙස අව ර
ස පු ර ද බලව තුන්මංසඳ වී නත ර

**39** උතුරු කරණ දන ඇති සිඳු සඳක ලී
මතුරු කරණ දන එඩි බිඳ හරින බ ලී
යතුරු කාරණ නැව්පෙල දූක දිදී රැ ලී
යතුරු කරණ දකුණ ඔරට නොවී මැ ලී

**40** මනකල් බස්දෙමිනිසකිමසඳ පොබය න
තුඟුතල් රුක නොඉඳ ගොස් නුඹ නුබකුසි න
සුවිස ල් ගම්‘මවන පව්රද නැග මුද න
මද කල් එහිද ගොස් සුබඳුරු රම පොර ණ

**41** ඉගැඹුරු අබි දහම් දැන වසන මන බ ඳ
සුබදු රු අරමපති දෙව්නඳ මහ තෙරි ඳ
දූකග රු කර නෙසැවැඳ සිහිනි පිරිසි ඳ
විසිතු රු සිසලූ එගි දූක යාගන් සබ ඳ

**42** තුන් රුවන් පුදන නැණවත් දන රඳ න
නන් අවන් හලිත පහ පෙළිනි බබල න
නන් දනන් සරණවේ මගිනි නදව න
අ ම් බ ල ම් ගොඩින යනසඳ පිරි සිරි න

43 පැ ප ත වෙහෙර'ඟිනි දනමන ඇදග ත්ත
තේ අත පළ **සුනඳ 'රම** ගොස් තොල සි ත්ත
**සෝබිත යති තුමා** පිරිවර සම ගි ත්ත
තා සි ත සතුටු කරමින් දක වැද ය ත්ත

44 පා නා විලස දෙව් විමනක් එම ගම ට
තා නා දෙසින් යන එන පොහොසත් දන ට
**නා නා සම** බලා ගොස් සුසැදු ලැගුම ට
තෝ නා නට බසිනු **මහදම්පා ගඟ** ට

45 මහදම්පා ගඟින්—එතරව සිරුර සතපා
මහදම්පා ය කරවා—එනමලත් ගම වත් සඳ

46 සත් සඳ පිණන **ගඟ අරමට** කර ගම න
නිත්සඳ ලෙසින සන්දන නදන කරව න
දත් සඳ ලකර පෙලසකු ඇ සවියර ණ
මිත් සඳ **පෙම් රුවන** තෙර නැමදයාන න

47 එගම්වර සිරිසර—ඉඩන්තොට ගඟ ඉවුර'ස
සත් දිසි නිති නිමල් සිල් ගුණ ලෙස සුදුසු
**අන් දිසි යති** සඳුගෙ විසුමට. ලෙස සුදුසු
**සැම්සොන්ද ආබෙව්—රදපස මුදලි මැතිඳුගේ**
මව් ව න **කැරලැයින් සොයිසා සිරි වඩ** න
මව්මෙන ලෝ ස සු ත් වැඩු මැතිනියද'රි න
යා පත් ලෙස කරවු **සුවිසුදු අරම වැ** ද
තාසින් තොසින් නමකර පළමු බෝර ද
මානි ත් වැඩුම හිත ඇති ගුණැ'ති නිවර ද
යාමි ත් නැමද නොවලස **සොමනඳ තෙර** ද

48 කදුරු වැටකේ ඇ—නෙකුදුතුරු මුළු ගහනවු
දුල්වෙල් සිරිබලා—**සිරිවඩන රම** වත් සෙද

49 ස ද මි වස් නකය වැඩුමට තැබු නිත ර
"**සුද මි කරු සබය**" උප පති වන මෙව ර
අ ද මි ලොවැදුරු'රලන ලෙස කරණ්වෙ ර
**එ ද මි තිලක මාකම්** ඇදුරුදකුව ර

50 නම ක ර පලමු බෝරද පිළිරු සත ර
හැම ව ර බික් සගන ඇදෙන සද සත ර
**ගුණැජර දම්තිලක** මහතෙරිඳුපා ස ර
ග රු ක ර පසෙක සිට වැඳයත් ගෙණ'වනු ර

51 ප තැ ල . දෙ ස් පැමිණ තුග අරමට ව   රණ
කොමල බ ස් දෙමිනි යනි සඳ නද ක   රණ
වි මල නි ස් නොවිඳු සිත රකිනා ස   රණ
ක මල තො ස් නැමද නුබනැගයාක   රණ

52 පොජ ණ වනවාස වෙහෙරට ගොසින් ස   රු
ස ච න සසුන සර පිපි පඬරේ'ව මහ   රු
දි ලෙ න සුමන තිස් තෙරි දුහෙ පා තඹු   රු
ද ස න කර නැමද නොවලසයත් මිතු   රු

53 සැදූසිල් ඇ උවසු—ගුණෙනිපිරිසත් ගුණවත්
ආද්‍රිස් ද සිල්වා—ගුණවඩන මැතිකරවූ

54 තවපුත්ට විසුමට—සුදුසු මනරම්අසුනැ'ත්
ශල්දූවෙ අරමට—යන්ට මග ලකුණක් අස

55 මොකැදුරු දුනිදන්කළ සැය පුවත   ර
වනා තු රු මගින් යන සඳ පෙනේ මග දු   ර
මඹි තු රු ඒ ලකුණ දක එහි ගොස් සිරු   ර
ගි ම දු රු කරණු ගෙණ සොඳ සීතල වතු   ර

56 විසිතුරු බල බලා නද ඇවිද තුරක   ට
නැගවිලිකුන් මිහිරි පලකා ඉවරකො   ට
ඇස මුව දෙවා අනතුරු එහි පිපි රුව   ට
දුසමන් මල් නෙලාගනු තුන්සෑ පුද   ට

57 එපෙදෙස සැදූවත් දන අරමට'වූ දි   න
සි වි ප ස හැමදලා කැලි කසල විගසි.   න
සළු තැ ස පිළිම මැදුරට ගරුලෙස පැමි   ණ
බලනොස වැඳ පුදන රහ පසෙක සිටග   න

58 මුනි මැදුරෙන් පිටව දන මන වෙත අද   න
සෙල් රද මුදුනකළ සෑ රදුට සතොසි   න
යන දන දක පහන් මල් පුදන විලසි   න
නොසිතව එදන යනුදේ එහි ඉදු බෙලෙ   න

59 පියපත් රුසින් දිලි බෝරද වෙත පැමි   ණ
පියසින් පෙරවුකර පුදකරණ දනග   න
පියපත් දෙක ගසා වෙත 'මුත් නුබ කුසි   න
පියසිත් වනසෙ නදදෙන් ඒ සියලූ දෙ   න

60 තුන් සෑවැඳ පිදීමෙන් ලැබගත් එපි නා
තුන් ලෝ වැසි සියලූ සතහට දෙනු වර ණ
තුන් ඒ පින් බෙලෙන් අත් පත් සකි කළ ණ
තුන් ලෝ සැපත අගවන මොක් පතනු මැ න

61 පත් ගිරු දවල් දින මෙම ලෝ වාසයට
අත් ගිරවන්සඳ රැ දින වාසය
පත් තොාව දුකට සුදුසුවූ නුඹෙ වාසයද
මිත් තුරකට නැග ගනු රැ වාසයට

62 සමන් කර පිබිද'රුණ තෙරුවන්ම ඉ න
සමන් සුරිඳු අයැදුම පිළිගෙණ පස හ
සමන් බඳුරු සිරිපද ළස තැබූ දිමූ න
සමන් ගිර පෙණෙන ඉඳුරෙන් බල ඇ න

63 ම න ක ල පලනෙලා'හරකිසඳ නිමක ර
නු බ න ල නැගනයන සඳ පියනදද ක ර
කොක් පෙ ල දුක නොවී බිය වෙල් මග අන ර
අ කු ර ල ගමට ගොස් විසිතුරු බල මිතු ර

64 තෙරුවන නිති පුදන දුරුකර මසුරුම ල
සු රුවන නැණිනි තම කිස කරණ නොපැකි ල
ස රුවන ලෙසිනි වැඩෙනාදනැ'නි ගුණදු ල
හි රුවන දිමුන වනතුරු එහි'ද පාසැ ළ

65 මතුක ල මොක් ලබණමෙන එම ගම රුඳු න
දනකැල සැදූසිතිනි කරවූ දෙමහළි න
**දමහ ලැ'** තුළ පිවිස **අසිසර ගෙර** සුගු ණ
නුබත ල නැග වඩන් පිණිපාකර තුටි න

66 පඬිදන මත පැළඳි–කිරුලෙ'ව් බැබලි සිරිනා
**නැණ නඳ** තමින පරසිදු දිනු තෙරිඳු ස ද
හැමසඳ කරණ පුදසිරි තෙරුවන පැ හැද
සත් දන කුලනිවෙස්–**කාහ**වේ සිරිද හරඹා
ස හ තු ට **සිරිසොබණ අර**ම වැද පසි දු
නමකොට **රු**ගෙණ අවසර **මෙද නඳ ගෙරි** ඳු
පිදුවන් නි ති න් දෙන සුපවර සැපත අ මා
මුදුවන් ගු ණෙ න් යුත් පිරි සිරි තොවන නි මා
සුදුවන් ග ලි න් කළ එහි දිලි පිළිමතු මා
වඳුමන් තො සි න් තබමින් හිස දෙරණ න මා

67 නමකර පිළිම හිමි—අත්කර කුසල් සිත් ලෙස
**ගොඩගම සිරිද** නරඹා—පමා නොවයා සකිසඳ

68 දු ල් නිත්තේ කිතුගොස ලෙව්දන'වෙ තය
ලොල් සිත්තේ තෙරුවන් ගුණ තැබු ම තය
**තෙල් වත්තේ** සිරිසර'යුර දූක තෙ , තය
ක ල් මි ත්තේ නොරඳුයාකරමෙ තය

69 පත්කිත් නොමද දෙස දෙස නිරතුරු සොඳු රු
**සුන්සන්** නැණිනි පෙර නිරිදෙක් කළ මහ රු
සත් සිත් පිණන සිරිදූරු පොරණ වැඩක රු
**රන්පත් වෙහෙර** අබතුර වදුව පස්ව රු

70 පිවිතුරු **විජයබා පිරිවෙන්** උයන මැ ද
විසිතුරු සබස මිණි ගණැතු'ල් කළ පබ ද
රද ගුරු **සිරිරහල් සනිසඳ** සැය න ද
සුමිතුරු බැබලිතැන ඒ බව දනු පැහැ ද

71 මුනිඳු දූ නිදන්කර සැදූසැය සො ද
දුම් දු සෙද දිලෙන පත් රැසිනි නලවැ ද
පසි දු ලක තුමුල් මුනි මැදුරු දෙකට ද
සකිඳු වැඳ ගමනකරතුරුඅතු නොවැ ද

72 තියුණු නැණ බරණ ගෙලෙ පැලඳි සුදි ලිය
දි යුණු වන දනන් සුමු වැසි **පැරැ** **ලිය**
කියුනු වණ එම ගැ'දුරු අයුරු නොමැ ලිය
න යනු මැන **සියුම් ගැබරම** වැද නි ලිය

73 අ ග අ ගා සුපිපි වැටකෝ තුරු ලප **ළු**
නැග නැ ගා සුවඳ මල් විද හමන ර ළු
ව ග ව ගා නලන වෙලමැද ලෙලි නෙර ළු
ම ග ම ගා ගමන කර'හන රහ යහ ළු

74 ගි හි ණි තුරු රැසිනි මග දෙපස මොනව ට
**සි නි** ගම් සයුරමැද පිහිටි අරක ට
නෙ දි නි දිලි සුරිදු කඳකුමර දෙවොල ට
නො සි නි ගොස් රැගෙණ යව ගමනට පිහි ට

75 පෙර වර නෙද රැසිනි බැබලුන රිවි අසු ර
ව ර වර පුරණ නෙක පින්කිරිය ලෙස නි ර
වැ ර සර දන වසන **තොටගමුවෙ** පුව්ත ර
සි රි සර බලා යනු මග 'තර නොව තත ර

76 දෑදිරූ මෑ පමණ—වෙන නොමැ'නි දුක් අසර ණ
ලෝසත් මතු සසර සයුරෙන් ගොඩලෑ ම
පෝසත් වන ලෙසිනි බුදුකුරු දම් සෑ ම
පුරමිණ ලොව සරණ—බෝසත් තුමෙකු ලේසි නා
පිරිහද'තුල් ලොසසුත්වැඩනිති කර ණ
සිරිසුමඟුල් මාහිමි උතුමා උප න
දප්කැඩු සතුරු සොර'රිවු දන නැති පම ණ
නිත්අඩු නොවන දන තෙද බලැති මැතිඟ ණ
සිප්කඩු ගම අවන් පහපෙල බලාග ණ
මිත්වඩු තුමුවුගලඋඩ වෙහෙරට කළ ණ

77 සි ඳ බිඳ හ රි න ලෙස නෙක කෙලෙසුන් රුදු රු
සෑ දූ හද දෙස න සදහම් නෙදනත් මඟ රු
සෑදූ නඳ න් මි න යුත් තෙර දකිමින් මිතු රු
ප ද වැ ඳ හැ දි න තොරතුරු දූනගන් සොදු රු

ඒ කුමාර මහා විහාරානතගීත පෞරාණික
ගුණෝතනමයක් ඇත, සබඳ එය තා
ශ්‍රවණා ලඞකාරකර.

78 දූන දම් විනය ඈ—කවනළු සතර සමගින්
කරපුද තමත් බව සසුනට සෑදූ සිතිනී
ම රයුද සසරසකමොක් වැනුමද බැතිනී
අ නාවස් දෙසුමය—ඈ කුදු නෙදම්පොත් ලියූ
තෙව ලා දම් සියල් පොත් ගැඹුරු නය ප ද
ලොබලා දත් රසය නතුලෙසිනි නිවර ද
මොකැදුරු සසුන සිරිලක වැඩුම උවක රු
පි වි තු රු දම් විනය සඟනට දෙන අයු රු
අ පැ දු රු ඇදුරු 'දුරු පැණසිහ නෙරිඳු ග රු
ම මි තු රු දනුව තැබු බැව් පිරිවෙණක් ස රු

79 උතුරු මෙම පෙර ගුණ—මිතුරු අදරින් සිත් ඇ ද
පතුරු වමින නු ව ණ—අතුරු අරමට ගොස් සො ද

80 මෙත් ගුණ සිහිල් කග—දළකිපි සෙනග නසනෙ'ව
නිසපිය සොම් ගුණය දුටු ඉරුකර රොසස
අස'පිය අවර ගිරවන්සෙද කර ගොසස
එය'රම වසන සඟ—නමකර රුගෙණ අවසර
මතු ලක් සසු න වැඩ පතනා කෙනෙකු ගෙ ණ
හසුන ක් රුගෙ ණ යනබව සැලකර සඟ න

රුවන් නියා මැදුරට පිවිස රැ දි න
සොඳින් පියා ගන දෙර මතුරු නවගු ණ
සතන් නියා සැතපී අරුණ නැඟිටි න
කරන් පියා සර නිදිතැනි නු'දූස න

81 නිරතුරු ලෙව් සසුන්—වැඩුමට සිතැ'ති ගුණවත්
දෙඩන්දුවෙ සජනන්—කරවූ **සෙල්බිඹු රම් ගොස්**

82 පිවිතුරු දම් කිරණ සෙවුමැ'ති පිය'දසි න
මොකැදුරු සිකවරණ නිති සිත් පිය කර ණ
විනැදුරු නමදරණ **නාහෙර පිය රුව** න
සුමිතුරු සිරිසරණ වැඳකර පිය ගම න

83 සස් දම් සිරි නැණ දන විකුමැ'ති සුද න
ගත් කම් සිරි පැහැර තම වෙන තරුණ'ග න
නිත් රම් සිරි සරිනි පිරුනෙන් නැති පම ණ
**රන් ගම්** සිරි බලා සකි සතොසව සෙදි න

84 **රදරම** ට ගොසින් දිය කෙළ ගිම දුරු ර
මන රම තෙ සැපොත්ගෙය වැඳ යලි මිතු ර
අප රම දගම්දේයනි අනසෙ කළස ර
එය රම **සුගත්** පල් යති නැමද යාක ර
85 පින් බර **අදිපියන් දබෙව්** නමින් ප ල
සුත් දර **මහමුදලි මැනිසඳ** තෙද ලක ල
ගත් බිර ගුණ සහන පිදුහැර මසුරු ම ල
**බන් ධර වතු** නමැති දූක පොල් උයන් පෙ ල

86 වේපස පමා නොව කා බොදුන දහව ල
සැපස ඇති අරම ගොස් සිදු වෙරල'ස ල
වීතොස නැමද නැග ඉඳ තුරකට සප ල
නාඇස සොඳු'ර දූක යව එපෙදෙස සිය ල

87 සිරිලක බුදු සසුන්—වැඩ කල තොමද සැදූයෙන්
බැතිහද ලෙව් පැවති දම් රැකි දෙසු සතර
පති රද දෙවි ඇමති ගුණ සිහරද කෙසර
සතෙ සින් කරවූ දූටු—දනමින් පිණන සිරිදූරු
**මහ දෙවි පතිර දනම් අරමට** ගොසි න
පැහැදෙවි සිය ගුණෙනි මුනිපුත් වන සඟ න
මුනිසඳ සසුන වෙන නිරතුරු බැතින් බර
දන සඳ පොබයමින් දම් දෙසනා ගැ ඹර
තුටු සඳ **සුළු සුමන** මහතෙර පාත ඹර
සකි සඳ නැමදයන් සම්බුනෙණ නැග අ ඹර

88 මල වැස්සා නමිනි—යුත් ගොඩ මැදින් නොවලස්
දූල සස් වෙල බලං—නිති දිවි රැකුම උවකරු

89 මහමඬල රමනම්—සුදම්හල ගොස් සුවිස ල්
අ පි ස් ගුණ පුරුදුකල දිව්හිම් මහ රු
නිශ්‍රෙ ස් ගුණ පතළ දසදෙස නිත් සොඳු රු
සියම් බුරුමය ඈ—මහරදුන් පිදුනෙ පඬු රු
ලංකා ගොඩ දිරනඳ ශිම්ඳු සිසුව න
දුඤ්නා පදවි මාතර දෙසට සහග න
ලෝනෙක දෙස පතළ දනදම් කර දන
පා නෙ ක නෙද වසන හදකළ එනි දන
නා ශ ක ශනිසඳුගෙ සුළු පදුම බි දන
පා දෙ ක වැ'ද වසර ගෙණ කරපත් යාන

90 සිරි ගණ නද වෙහෙරගිනි පිරි දිලි පො රණ
ශිශි ග ණ නද අරම අදිපතිකම ද රණ
සිරි සත නද සිනැති බෙදනට සිසුව රණ
ශිශි සැදූ නද නෙරිඳු වැදයව බැස දෙ රණ

91 මු නි ඳු බ ස් කිරණී 'නෙපෙදෙස දන අඳු ර
ප සි ඳු දෙස් වසත සුදසු න'රම බීදැ ර
සැ ඳූ ති ස් නමැති නායක නෙරිඳු ස ර
සකි ඳුනොස් සිනිනි වැඳයා නොවනත ර

92 තෙළසක් දූ ගැබැ'නි—සුදම් අරමට නොස් සකි ර
නමකර සියල් දූගැබි—බුදුශිශි තෙරද වැඳයා

93 දනගො ල්ලේ හැමව ර පින්කරණ ස ර
සි රි දු ල්ලේ නොවිනර ඉන් ලෝපත ර
ශි ෂිවැ ල්ලේ සිරිස ර නරඹා මිතු ර
සිතුලොල්ලේ මගත ර යා නොවනත ර

94 ම ත් තු ට දනත් සුමු—බඩු විකොට දන උපය න
ශිශ්නො ම අව ත් හල්—සිරිද නරඹන් සඳමෙ න

95 කත් අගේ තඹුරු හෙල් මැලි පු ලායා
මිත් වගේ සරණ කෙලි කෙලි දූ ලායා
ශිශ්ගනේ සයුර දියකඳ ග ලායා
ම ත් රගේ සිරිය මීතුසඳ බ ලායා

96 ද ත ත ද  කරණ තුන්බමු අරමට ගොසී  ත
මතකොද  දන පුබුදුවනදම් සතර දූ  ත
ම ත ත ද  සිකරකින නිති ඇසලෙස' දරි  ත
පැණ ත ද  මහ නෙරිඳු පාවැද යව තුටි  ත

97 උ දු ල්ලේ  සියලු කළයස රැසිනිස  ර
සි ය ල්ලේ  කරණ එකයුර දහම් ව  ර
නොමැල්ලේ  දිනිඳු අත්ගිර වැදුම පෙ  ර
ද ඩ ල්ලේ  ගමට සෙද සෙද යන් මිතු  ර

98 රදපස  තම සියල් ඛිස කෙලෙනි නිර  තුරූ
රදපස  නිත් ලන් මහමුදලි තත  තුරූ
රදපස  මුදලි මැණි ගණ විසු තෙද ඉ  තුරූ
රදපස  පහ පෙලද දූක යව සඳ පි  තුරූ

99 එගම්වර පෙර විසු—රදපස මුදලි මැතිස  ඳු
තවත් සැදූවත් දන—සමග කරවූ පිරිසි  ඳු

100 ලෝනෙකා  දෙස පලි—සැම වෙහෙ රඟිනි නිර  තුරූ
වා ලු කා  රම වැද—සෙද තද සිතින් සුම්  තුරූ

101 ස සු න ට  මුනිකාලි'පමණ වැඩම තිරස  ර
මොනවට  සිල් ගුණෙනි බැබලුනා'පපර පු  ර
වෙව ක ට  වෙහෙර අදිවැසි මෙදතඳ එතෙ  ර
නමකොට  ගණුව රැදින විසුමට'වස  ර

ඉක්බිති දිශානතයෙහි පැතිරි සත් තේජසක් ඇති
ප්‍රවර වාලූකා රාමයාගේ ගුණොත්තමයක්
වර්ණනා කරමි, සබඳ හෙදනා කර්ණ භරණකර.

102 සක වසිනෙ'ක් දහස්—සත්සිය සවිසි වසරෙහි
සොද යස තෙද නැණ දන ඇ ඉසුරූ දි  ළී
ර ද ප ස අදිරියන් දුම්‍රෙව් මහ මුද  ළී
මැනිසඳ දහම්කඳ—අදිකම් ගිම්දුබ දූ'දි  ළී
ස සු න්  වැඩ කෙරූම හිත ඇති මෙඹබ  තුමා
ගොසින්  අමර පුරයට සහරද උ  තුමා
අසර  ක ර සියලූ විනෙකම් නොවසැ  කය
අමර  පු ර කරණසුරූ දූන නොව ලැ  කය
අමර  පුරරත' වුත් පසු අප සිරි ල  කය
අමර  පු ර න මින් තබනට යැදි ත  කය

103 එස ත් යැදුම පිළිගෙණ නොහැර අදරි න
තම ත් බව ලොලයහැරසසුන ලොබයෙ න
තම ත් වැසිව විසු **බෝපා ගොඩ සුම** න
නමැ'ත් පින් පිඩක් බඳු **හිමිඳු** සමගි න

104 කැටුව යාමට තව—ගිහිපැවිදි පිරිසක් හා
සුබ නැකතින සියලූ මග උවරනදසො ද
ලැබ නෙක පඬුරු පුදකරණට එසග ර ද
නියමකොට දිනයද—සමු රැගෙණ මුදලිඳු ගෙ න
පු ද කො ට තෙරුවනට අත්බව යන ලෙසි න
නැ ව ක ට නැග පිරිස සහ මැති අණ ලෙසි න
පෙම්බැඳ සසුන ගොස් පෙර දෙස **අමරපු** ර
ද ම් ර ද පුත් මහ **සඟරද** ඇසුරුක ර
ද ම් ස ද සත විනෙ දූන උපසපන්ස ර
තු ම් ල ද රද **රද ගුරුනාසද** අද ර

105 මෙ හි අ ද ලකිඳු ගෙණ ලැබගන එතනතු ර
වැඩසො ද කළ පිහිටුවා නකය' මරපු ර
**ද ම් ක ද මහා නායක මාහිමි** පව ර
විසු සො ද වෙහෙර ඒ යයි දනුව මමිතු ර

106 හිමි න එම' තුඳ සිසුවන පුද ඇදු රැ
නර න දෙරට ලද **නාපදවිනෙක** ග රැ
**සුම න මහා නායක හිමිඳ රද** ගු රැ
සසු න වැඩකළේ එහි වෙසෙමින මිතු රැ

107 දිරනද **එ මාහිමිසඳ** පුදු'දුරු නිස ළ
දිරනද දම් විනය සත දත් සිල් ලක ළ
දිරනද **වන විනිස'රුක් වියකනද** ක ළ
**දිරනද** මාහිමිඳු අතිදුසිසුපක ළ

108 **විනෙමහ අරුත් කත සත්නස** කළ මහ රැ
ල ද ම හ සහන **සිරිවිසු** දැමෙ නම ග රැ
පැනම හ කා සිත් වෙරදුරු පඬි ඇදු රැ
**පැණසිහ** මාහිමි දනු එහිමි සිසු ග රැ

109 සියුම් ගැඹර විනෙදම් සයුර පසුක ළ
උතුම් සත ර දත් **හිම්නයදපණ** ක ළ
**එද ම් ලකර නාමා හිමි** ලෝ පත ළ
උතුම් එ පර පුර පස්වෙනි සිසුය දු ළ

110 සවණ   සසුන වැඩුමට සිතැති හැමව   ර
සවණ   දම් දෙමිනි දන හද පුරණ ති   ර
සවණ   සුත **ඇදුරු සුදසුන්** හිමි පව   ර
සවණ   සිසුය දනු එම පරපුර මිතු   ර

111 කලණ   එම අරම දසදෙස කිත් පැ   තුරු
ලලන   සඳ නදය දෙමි'නෙ තුරු නොම   තුරු
ද ලන   නිති මහරු  දද පෙලැ'ති විසි   තුරු
බ ලන   නෙත් යුගල ඇර නොහැර මම්   තුරු

112 රද ඇමති උතුමන්—පිදු පුද පඩුරු අග   නා
දෙසයස සුවඳ පැතුරුණ අරම විසි   තුරු
සහතොස දක නෙසැවැඳ සිතිනි පිවි   තුරු
**රදගුරු සිරි සුමන—නාහිමිඳු සැසඳ   වැද**
පබාකර අවර ගිරවන් සෙද මිතු   රු
නොබා කරනදයසදකර  දක සොඳු   රූ
මෙ වියු   ගුණ ගණ දතා සිතු ගැබ න   දින
නොවියු   අන් ගුණද සිතුයම්කර සො   දින
එ  වි යු   ලෙසින සැතපී උදය පසු   දින
ම  වි යු   පෙර මගා රහ දක යව සෙ   දින

113 සුරලොවින්   පහල දෙව් විමනෙ'ව් ලක   ළු
සැමසිරි  න්   සපිරි පහපෙල අවන්හ   ළු
තුනුරුව න්   පුදන පබුදනැ'ති හැමක   ළු
සකි ව ඩ න්   **ගාලු පුර** සිරිදක සිය   ළු

114 වික් මෙ න්   තෙද නැණි න්   ලෙව් දනවෙත කැ   න්දූ
නින්නෙ න්   තු නු රු ව න්   ගුණ තම සිත රැ   න්දූ
**ඇ ඩි ම න්   ගුණ රුවන් නම්යුන් මුදලි   න්දූ**
නොස්නෙත්   බලා යත් ගරුකර මිතුරි   න්දූ

115 මනහ ර   **පරම නඳ වෙහෙරට** තොස පැමි   ණි
බැතිබ ර   අප ඇදුරු පර පුර ගුණ දර   ණි
පුවත ර   ගුණැ'ති **සිරිසඟ තිස් හෙර** වර   ණි
ප ද ස ර   නැමද පවසා යලි තොප ගම   ණි

116 සක පු ර   දිසි සුදම් දෙව් සබ සිඳ නොල   ස
ලක'ඹ ර   දකණ විස්කම් මැවිලෙු සහ   ස
සැක ක ර   ණා ලොදන දක පුදුමව සතො   ස
ද  ක ව ර   විසල් **දම්හල** අඹරට පිවි   ස

117 **දෙව් අතුරේ සුදම්**—**අරමට** ගොසින් මනරම්
ය ව මිතුරේ තුටින්--**සගනඳ** තෙරද වැඳලා

118 දු ල්තේ සිරින් ස ඳ—පබුදන රඳන ගුණයුත්
**කල්පේ ගමින්** ඡසඳ—යාගත් මිතුරෙ නොරඳ

119 **කතළුවේ** පහසිරි—දූක ඉසුරුමත් දන රැඳි
යහ ලූවේ මනපිරි—එහි යතුරුකර නොම රැඳි

120 පහන් සිත් තෙරුවන—සුදනනියවත් නිවස න
**අහස්** ගම සිරි දූක—ගහන් මගසෙද යාග න

121 අරිබිඳැ'ර කවසත්—**විසුදම් රුවන යති** **පති**
**අපි අකර අරමද**—වැදසකි ගමන යහ පති

122 ස ව ණ සසුන'ඹර දිසි සඳලෙස සුනිම ල්
සොඳින එකලූකළ **නාසඳ සිරි සුමගු** **ල්**
ද ප න **වැලිගමට** ගොස් සකිසඳ සිතුලො **ල්**
ද ස න කර පැහැද සිරි නොනැවත වැඩික ල්

123 ස ත්ලෝ නොමද කුළුණැ'ති තිරිදෙක් පො රණ
කිත්ලෝ පසිදු වැලිගම සැදු මනහ රණ
**අග් බෝ** **වෙහෙර** ගොස් දනසඳ පියක රණ
මින් බෝ තුටින් **බෝරද** පිණිපා ක රණ

124 මැ ද්දේ මුනි සසුන්—දිලෙන සත් දත් ගුණව ත්
බ **ද්දේ ගම දහම්**—**රුවන හෙර** වැදයා ග **ත්**

125 පඬි දනහස් කැලට—විසුමට විලක් බදු සො ඳ
මා නොටනම් පුරට—පැමිණිසෙදමා සකි ස ඳ

126 ල ක 'ල ක බට මෙ ත් න සිරිනෙත් පිණාලිය
නෙක නෙක විලසි ත් න දනා මන දිනාලිය
එ ක එ ක මුවකි ත් න වියුනොහෙ වණාලිය
දූ ක දූ ක සිතුමෙ ත් න මානොට කනාලිය

127 නිල්වලා මැදින් නික්මෙන රඝ පු ත්න
නිල්වලා සිරි න් ලෙව් හිතමේ මෙත්න
නිල්වලා ගඟි න් එතරව සතො සි ත්න
නිල්වලා මගි න් දෙව්පුරයා ග ත්න

128 පුරව ර  ඇවිද සිව්දෙස තැන තැන ලසු  ර
සිරිස ර  නොමද නරඹා සුගැ'ස යොමුකා  ර
සිහිකර  මතුරු නවගුණ අම බෙහෙද ව  ර
මම්තුර  හියවකට වෙහෙරට යතුරු කා  ර

129 ඉරු ක ර  සදිසි නෙදනල දිගනෙහි හම  න
එවෙහෙ ර  ඉසුරුවන නෙරවර සිසඳැව  න
න ම ක ර  රුගෙණ අවසරගන ඇර ගිම  න
සි රි ස ර  සකි බලනු විසිතුරු අඩු නොව  න

130 දු ල්  සිතුයම් උතුම් මුනි මැදුර'වට සැ  දු
කල්  තුහු පවුර ඇතුළට නැගුමට සුසැ  දු
ග ල්  පඩි එපියගැට සුගමුල නිති වොරැ  දු
ගල්  ඇත්රූ සතර දූක බියනොව සබ  දු

131 ස ත් පියකරු  නිරිදෙක් සැදූවත් පො  රණ
සි ත් පියකරු  පුද බඩු මැදකර ව  රණ
නි ත් පියකරු  වන මෙන් කළසැ පො  රණ
මි ත් පියකරු  වදු හිස තබමින් දෙ  රණ

132 පෙරුමන්  දස පුරා බුදුබව ලත් එදි  න
පිටදු  න්  ඇසතු පරපුර නොසිඳ පැවතෙ  න
අවරි  න්  දිලෙන සෑයට පත් දද පෙලි  න
සතොසින්  බෝ දුමිඳු පිණිපා කරනද  න

133 බු දු ර ද  පවර දෙව්රම් වෙහෙර ගඳකි  ලී
වැ ඩ හි ද  දම්දෙසු සුර නිවණ කලිහෙ  ලී
බැදිසොද  මුනිමැදුරැ'තුල පිවිස නොව මැ  ලී
පි රි ස ද  පිළිම හිමි වැඳ පිටව සුනිම  ලී

134 ගලතු රු  දුලවැඹ පෙලමතු කළ රුව  ට
ගලතුරු  මුල පායුර දූන් දසනකො  ට
අනතු රු  වැඳ පුද ලත් පින් දෙවි රදු  ට
සිතතු රු  දෙනුව යනුමැන දෙව් මැදුර ත  ට

135 ල බ ණ ට  පි හි ට  සුරිදු ට  යැදුම ට  පැමි  ණී
ද න හ ට  පි හි ට  වනවි ට  මොනවට  තොසි  නී
දෙවොලට  තුල ට  වැදඉ ට  පසසිට  බැති  නී
දෙ වි දු ට  සොඳට  වැඳ මැන පින් දුනෝති  නී

136 දූමුනිත් නෙද ඔසුව—ලෝසත ගතට කුළුණි ත්
එසුසිඳු රුසිරි වණනට—මළුක මුවසකි අසම ත්

137 සැ ම ස ත වදන් අසනට නැමු කැන් සුව ල
දියනෙ ත , උසුල්වන් සුර රදහට ලක ළ
තොපසි ත මද පමණ කුදු නොකරම සස ල
එ පු ව තු සැලකරව සකිවනලෙස සප ල

138 සිරිබරදකණලක—ගාළු නම් අගනුවර ට
උතුරෙන් දිසි මෙරන් දෙඹගම සුපි හිටිය
ඉසු රෙන් කිසි නොඅඩු නෙක කෙත්වත් පිටිය
උවසු ගුණදම්නා=පිරිසත් දිනෙස් මැන්දි ස්
විකුම් රුවන සෙන්නා නමිනි, යුත් වන
මුහන් දිරම් මැතිසඳ නොවෙනි පුග් වන
උ තු ම් ක ර ණ සුසිරිත දුසිරි නැති රු ති
පැතු ම් ක ර ණ ලොසසුන් වැඩුම නිති බැ ති
උ තු ම් පොර ණ අප බස දියුණුවැ ' කැම ති
විකු ම් රු ව න එච්. ජේ. ඇම්. නමැති මැ ති

139 ම න් තුට පුද පඩුරු දි සමරකර ගු ණ
ම න් මෙනා කිවි බසින් විලසින සැලකර ණ
පෙ ම් කොට මෙමට ඇරයුම්කලෙ ගරු ලෙසි න
දූ න් එය සුර රදුනි කුළුණෙන් අසනුමැ න

140 පෙර සිටි කිවි වරුන්--වැණූ කොස්ගොඩ ගමැ'තුල්
මන නන්දේ පිරිසොඳ සැම වෙහෙරහි න
වැලිකන්දේ සිරි සුදසුන් රම්බර ණ
සඟපත් ඉඳුවිමල—හිස්මග නොසිඳු සිසුව න
කුළුණෙ න මව් සදිසි ලෙව්දන පුද කර ණ
පෙලෙම් න දරුණු ඇස්රෝ දුකිනි නිවස න
සිරි සදහම් විනෙ මුනි දෙසු දූන සොදි න
සිරි ලක අමරපුර නායක ඉසුරුව න
සිරි සදහම් වස් පල් තුම ලත් සඟ න
සිරි සුමඟුල් මාහිමි සඳුට සෙතදෙ න

141 නිත් දනහද පුරණ නායක හිමි සඳු ට
ප ත් ඇස් රෝ දුරුර සුවදුන හොත් ගන ට
කි ත් කිරණින දනමන පුබුදුව නො'බ ට
ස ත් මතු ලොවග බුදුබව අග්වෙයි සොඳ ට

142 සිරි ගුණ සසුන වැඩුමෙහි නියැලි මෙවක ට
සිරි සුමඟුල් මහනායක මහිමිඳු ට
පිරි තෙද කිරණ සුරිඳුට සෙතදෙන ලොව ට
පිරි සෙත තෙවිටක්මයදු සුවදෙන ලෙසි; ට

143 එදෙවො ල නුවර රඝුවට සිරිසෙත් විල ස
පෙල පෙල උදුල ගල්වැම් අවට දිලි ය ස
පැ හැ දු ල දෙව් විමන්වල රැඳි දෙව් පිරි ස
වැ ඳ ය ල සඳිනු මෙය සලසනට නොවල ස

144 සිය පස ක් ගුණෙන් ලෙව්දන කළ නද න
සිය කිස ක් සෙසකි මෙය ඉටුකර දෙමි න
සිය ඇස ක් අයුරු බඳිමිනු හා තොසි න
සිය වස ක් පවතු මල් කවුඩු මන මෙ න

* නි මි. *

— කතුහම් දැකුම. —

145 තිලොවට ඇදුරුවන—මුනිදු පිරිණිව් වසරින්
දෙදහ ස් හාරසිය සතළිස් නවය ව න
මෙම ව ස් බක්මසංව පසළොස්වක් මෙදි න
මහමඟුල් සමුදුර—අරමෙහි වසන නදනා
ලකංමර පුරනකය සඳමඩලෙංව් පව ර
එකපඬි බබුලුවා විසු හිමිදම් ලක ර
වම න යුරු සියල් දම්පොත් දුටු ඇසි න
විය න මුනි දහම්දෙසුමෙහි ලොවැසි ද න
නියත සබැ කෙසර සිහරද මෙන් දිලු න
සුගත වස් නෙරිඳු වැඩු යුග ඇස ලෙසි න

146 මොකැදුරු මුනි වදන් සිහතෙල රන් බඳු න
දැන සතු සිහල ඈ නෙකසත මන් ලෙසි න
ලොපතල මහවෙහෙර අදි වැසිව් නිවස න
සුදසුන් නෙරිඳු පාසෙවෙනෙහි දැන් වැඩෙ න

147 පෙර අවර දිගබස්—දැන නිදහු තතතුර ලැබ
කිතුනිලිය නැවෙව්ලෙව් ගැබ එක තු ලිය
සිතුඇලිය සසුන් වැඩ වැඩුමට නි ලිය
කොකැමු කැනෙි ඈ—සඳෙස් ලියු සිය බසි නා
හැන්රි ජෝන් මැන්දිස් එව්කුම් රුව න
සෙන්නා මැතිඳු කල ඇරයුම ගෙණ බැති න

සඳුන සත ර  බැති බර **රන්දෙබෙ**  උපන
සසුන නිත ර  සියබස වැඩුමද  පතන
**සසුන ලක ර**  නම් යුත් මුනිපුත්  විසින
සසුන පව ර , මෙකළේ සතදත්  ලෙසින

148 සියලූකල දිලේවා ලොව බුදු ස  ස්න
සියලූකල වසී වා වැසිසස් පු  ස්න
සියලූකල දිනේවා ලකදන තො  ස්න
සියලූකල දිලේවා ලක මේ හ  **ස්න**

149 ලදරු වයසින් යුත්—මවිසින් ගෙතූ මෙසදෙ  ස
දෙසැ'තැත් නොගෙණ පඬුවෝ—මනැ[redacted] වෙත්වා නිති තොස්

150 ලොසසුන් වැඩ පතා—කළ මල් කවුඩුනම් යුත්
ඉ සි ව [redacted] දනන් හැර—මෙසදෙස කහට නොරිසිද ?

සෙත් වේවා.